# නිවැරදි කළගුණ සැලකීම සහ දානයේ අනුසස්
## දක්ඛිණාවිභඞ්ග සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, මජ්ඣිම නිකාය 3 - පිටු අංක 520 - 527)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයේ වැඩ වසන සේක. මහාප්‍රජාපතී ගෝතමිය අලුත් වස්ත්‍ර යුගළක් ගෙන බුදු රජාණන් වහන්සේට වැඳ එකත් පස් ව සිට මෙය සැල කළාය.

“මා විසින් ඔබ වහන්සේ සඳහා ම පිළියෙළ කළ මේ අලුත් වස්ත්‍ර යුගළ, මා කෙරෙහි අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා”.

“ගෝතමිය, සංඝයාට පූජා කරන්න. එසේ කළ කල්හි මම ද පුදන ලද්දේ වන්නෙමි. සංඝයා ද පුදන ලද්දේය”.

මෙසේ ගෝතමිය නැවත නැවත තුන් වරක් දක්වා පූජා කිරීමට උත්සාහ කළ ද, භාග්‍යවතුන් වහන්සේ සංඝයාට පූජා කරන ලෙස වදාළ සේක.

එවිට ආනන්ද තෙරණුවෝ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසූ සේක.

“ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මහාප්‍රජාපතී ගෝතමියගේ මේ අලුත් වස්ත්‍ර යුගළ පිළිගන්නා සේක්වා. ඇය ඔබ වහන්සේට බොහෝ උපකාර කළාය. සුළු මව ද වූවාය. කිරි දී හදා වඩා පෝෂණය කළාය. එසේ ම භාග්‍යවතුන් වහන්සේ ද මහාප්‍රජාපතී ගෝතමියට බොහෝ උපකාර කළ සේක. භාග්‍යවතුන් වහන්සේ නිසා ප්‍රජාපතී ගෝතමිය තුනුරුවන් සරණ ගියාය. පන්සිල් රැක්කාය. තුනුරුවන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාය. ආර්යකාන්ත සීලයෙන් යුක්ත වූවාය. චතුරාර්ය සත්‍යයේ ද නිසැක වූවාය”.

“ආනන්දය, එය එසේමය. යම් පුද්ගලයෙකු නිසා තව කෙනෙක් තුනුරුවන් සරණ ගියේ ද, ඒ පුද්ගලයාට කළගුණ දක්වා අවසන් කළ නොහැකි යැයි කියමි. කුමකින් ද යත්; වන්දනා කිරීම, දුටු විට අසුනින් නැගිටීම, දොහොත් මුදුන් දී වැඳීම, උපස්ථාන කිරීම, ගෞරව කිරීම, සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් ආදිය පූජා කිරීමෙනි.

එසේ ම ආනන්දය, යම් පුද්ගලයෙකු නිසා තව කෙනෙක් පස් පවින් වැළකුනේ ද, ඒ පුද්ගලයාට කළගුණ සලකා අවසන් කළ නොහැකි යැයි කියමි. කුමකින් ද යත්; වන්දනා කිරීම, දුටු විට අසුනින් නැගිටීම, දොහොත් මුදුන් දී වැඳීම, උපස්ථාන කිරීම, ගෞරව කිරීම, සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් ආදිය පූජා කිරීමෙනි.

එසේ ම ආනන්දය, යම් පුද්ගලයෙකු නිසා තව කෙනෙක් තුනුරුවන් කෙරෙහි අචල ප්‍රසාදයට පත් වී ද, උත්තමයන් ගරු කරන (ආර්යකාන්ත) සීලයකින් යුක්ත වී ද, මේ පුද්ගලයාට කළගුණ සලකා අවසන් කළ නොහැකි යැයි කියමි. කුමකින් ද යත්; වන්දනා කිරීම, දුටු විට අසුනින් නැගිටීම, දොහොත් මුදුන් දී වැඳීම, උපස්ථාන කිරීම, ගෞරව කිරීම, සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් ආදිය පූජා කිරීමෙනි.

එසේ ම ආනන්දය, යම් පුද්ගලයෙකු නිසා තව කෙනෙක් චතුරාර්ය සත්‍යයේ නිසැක (සෝවාන්) වී ද, ඒ පුද්ගලයාට කළගුණ සලකා අවසන් කළ නොහැකි යැයි කියමි. කුමකින් ද යත්ත වන්දනා කිරීම, දුටු විට අසුනින් නැගිටීම, දොහොත් මුදුන් දී වැඳීම, උපස්ථාන කිරීම, ගෞරව කිරීම, සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් ආදිය පූජා කිරීමෙනි.

ආනන්දය, පෞද්ගලික දාන දාහතරකි. ඒ දාන අතුරින්,

1. තිරිසනෙකුට දන් දී සිය ගුණයක ආනිසංස ලැබීමට කැමති විය යුතුය.
2. දුස්සීල පෘථග්ජනයෙකුට දන් දී ආනිසංස දහසක් ලැබීමට කැමති විය යුතුය.
3. සිල්වත් පෘථග්ජනයෙකුට දන් දී ආනිසංස ලක්ෂයක් කැමති විය යුතුය.
4. බුදු සසුනෙන් බැහැර කාමයේ පහ වූ රාගය ඇත්තෙකු (ධ්‍යාන ලාභියකු) උදෙසා දන් දී කෝටි ලක්ෂයක් ආනිසංස කැමති විය යුතුය.

5. සෝවාන් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට දන් දී අප්‍රමාණ සංඛ්‍යාවකින් කිව නොහැකි තරම් ආනිසංස කැමති විය යුතුය.
6. සෝවාන් පුද්ගලයෙකු ගැන කවර කතා ද?
7. සකදාගාමි ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකු ගැන කවර කතා ද?
8. සකදාගාමි පුද්ගලයෙකු ගැන කවර කතා ද?
9. අනාගාමි ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකු ගැන කවර කතා ද?
10. අනාගාමි පුද්ගලයෙකු ගැන කවර කතා ද?
11. රහත් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකු ගැන කවර කතා ද?
12. රහතන් වහන්සේ කෙනෙකු ගැන කවර කතා ද?
13. පසේ බුදු රජාණන් වහන්සේ කෙනෙකු ගැන කවර කතා ද?
14. සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙරෙහි දුන් දානය පිළිබඳ කවර කතා ද?

ආනන්දය, සාංඝික දාන හතකි.

1. බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී යන උභය සංඝයාට දන් දීම.
2. තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි, භික්ෂු භික්ෂුණී යන උභය සංඝයාට දන් දීම.
3. භික්ෂු සංඝයා උදෙසා දන් දීම.
4. භික්ෂුණී සංඝයා උදෙසා දන් දීම.
5. මෙපමණ භික්ෂුන් ද, මෙපමණ භික්ෂුණීන් ද, මට සංඝයා කෙරෙන් දෙනු මැනවයි ලබා ගෙන සංඝයා කෙරෙහි දන් දීම.
6. මෙපමණ භික්ෂුන් මට ලබා දෙන මෙන් ඉල්ලා සංඝයාට දන් දීම.
7. මෙපමණ භික්ෂුණීන් මට ලබා දෙන මෙන් ඉල්ලා සංඝයාට දන් දීම.

ආනන්දය, අනාගත කාලයෙහි බුද්ධ ශාසනය විනාශ කරන්නා වූ, දුස්සීල, පවිටු ස්වභාව ඇති, කහ සිවුරු දරන්නා වූ (කසාවකන්ඨක) කෙනෙක් සිටිති. ඒ දුස්සීලයන් කෙරෙහි ද සංඝයා උදෙසා දන් දෙති. මම එකල්හිත් සඟ සතු දානය අප්‍රමාණ සංඛ්‍යාවකින් කිව නොහැකි අනුසස් ඇතැයි කියමි.

කෙසේ වත් සාංඝික දානයට වඩා පුද්ගලයෙකුට දෙන දානය මහත්ඵල යැයි නොකියමි.

දානය පිරිසිදු වන ක්‍රම හතරකි.

1. ප්‍රතිග්‍රාහකයාගෙන් නොව දායකයාගෙන් පිරිසිදු වන දානය

   මෙහි දායකයා සිල්වත් වෙයි. දානය ලබා ගන්නෝ දුස්සීල වෙති. පවිටු ස්වභාව ඇත්තෝ වෙති.

2. දායකයාගෙන් නොව ප්‍රතිග්‍රාහකයන් හේතු කොට පිරිසිදු වන දානය

   දායකයා සිල් නැති පවිටු කෙනෙක් වෙයි. දානය ලබා ගන්නෝ සිල්වත් වෙති. යහපත් ස්වභාව ඇත්තෝ වෙති.

3. දායකයාගෙන් හෝ ප්‍රතිග්‍රාහකයාගෙන් පිරිසිදු නොවන දානය

   මෙහි දානය දෙන්නන් හා ලබන්නන් යන සියල්ලෝ ම දුස්සීල, පවිටු ස්වභාව ඇත්තාහු වෙති. මෙය දෙපාර්ශවයෙන් ම පිරිසිදු නොවන දානයකි.

   මේ දානය මහත්ඵල යැයි නොකියමි.

4. දායකයා කෙරෙන් ද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් ද, පිරිසිදු වන දානය

   මෙහි දානය දෙන අය හා ලබා ගන්නා අය යන දෙකොටස ම යහපත් හා සිල්වත් වෙති. මෙය දෙපාර්ශවයෙන් ම පිරිසිදු වන දානයකි.

   ඒකාන්තයෙන් ම මේ දානය මහත්ඵල වෙයි.

“යමෙක් පහ වූ රාග ඇති ව, දැහැමින් ලැබෙන දෙයින්, පහන් සිත් ඇති ව, මහත් වූ කර්ම ඵල අදහමින් වීතරාගී උතුමන්ට දානයක් දේ නම්, ඒ දානය ඒකාන්තයෙන් ම ආමිස දාන අතුරින් අග්‍ර යැයි කියමි”.